ගොවිසවිය
e magazine

පැරණි වාරි තාක්ෂණය

හා බද්ධ වූ ආගමික ස්මාරකවල අප නොදත් විෂයානුබද්ධ පසුබිම

> "රුවන්මැලි දාගැබේ පාදම හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව සිදුකළ පර්යේෂණයකදී, එහි පාදම, යකඩ දැල්, රිදී ලෝහ ස්තර, සහිත එකක් බව, මහා වංශය ද පරිශීලනය කරමින් පවසයි."

පැරණි වාරිතාක්ෂණය යනුවෙන් සඳහන් කල විට, පොදුවේ අප කාහටත්, මැවීපෙනෙනුයේ බිසෝ කොටුව, රළපනාව,පිටාර ඇළ වැනි අංග සමහරකි. ඒත් බෞද්ධ සංස්කෘතියෙහි වන්දනීය ස්මාරක අතර, ප්‍රමුඛත්වයක් රැගත් ස්ථූපය හෙවත් චෛත්‍යය වාරිකර්මාන්තය සමග පවත්නා සම්බන්ධය පිළිබඳව ඔබ කිසිවකු කල්පන නොකරනු ඇත. ස්ථූපය නමැති ආගමික හා වාස්තු විද්‍යාත්මක ස්මාරකය පිළිබඳව විස්තෘත අධ්‍යයනයක් ලෙස මහාචාර්ය සෙනරත් පරණවිතාන විසින්. The Stup in ceylon නමැති ග්‍රන්ථය ලියනු ලැබ තිබේ.

එහි එක් පරිච්ඡේදයක, ස්තූපය විශ්වයේ සංකේතයක් බව මහාචාර්ය පරණවිතාන සඳහන් කරයි. හැම ස්තූපයකම පාහේ ධාතු ගර්භයේ මහාමේරුවේ කුඩා ආකෘතියක් තැන්පත් කර ඇත. පැරණි ඉන්දියානු ජනශ්‍රැතියේ මහාමෙර යනු විශ්වයේ ඇති විශාල ආකෘතියකි. එහි මතුපිට තව්තිසා දෙව්ලොවත්, එහි පාමුල නාග ලෝකයත් ඇති බව එහි කියැවේ.

ඒ අනුව මහමෙර යනු, ඉන්දියාවේ පිහිටි උස් කන්දක් නොව විශ්වලෝකයේ ඇති ආකෘතියකි. මේ ගැන අදහස් දැක්වූ බලන්ගොඩ ආනන්ද මෛත්‍රීය ස්වාමින්වහන්සේ විශේෂ සංකල්පයක් හඳුන්වා දී ඇතැයි උන්වහන්සේ සමඟ ඉතා සමීපව ඇසුරුකළ ලේඛක සමුද්‍ර වෙත්තසිංහ සඳහන් කළේය. එනම් මහමෙර යනු අප සෞරග්‍රහමංඩලය ඇතුළත් විශ්වීය පද්ධතියේ ඇති කිසියම් ආකෘතික රටාවක් බවය. ආතර්. සී. ක්ලාක්ගේ Profile of the Future second part සහ The Deep range වැනි කෘතිවල ද, විශ්වයේ එවන් අදෘශ්‍යමාන ආකෘති ගැන කියැවේ.

ස්තූපයේ සිව් දිසාවේ ඇති වාහල්කඩ නම් මුහුණත් හතරද මහමෙර නම් ආකෘතියේ මුහුණත් බව පරණවිතාන මහතාගේ අදහස වූයේය. එසේම, චෛත්‍ය පිළිබඳ ලියවුණු සංස්කෘතික ග්‍රන්ථයක් වූ "චෛත්‍ය සේවානුශංසාවදානය" යන්නෙහි පලමුවන ශ්ලෝකයේ, චෛත්‍යට පුද සත්කාර කරන මිනිසුන්ට ලැබෙන ආනිශංසයක් ලෙස ආකාශ ගංගාවේ සුගන්ධවත් ජලය නිතර ලැබෙන බව දක්වා තිබේ. මේ සියල්ල සංකල්ප පමණක් ලෙස නොගතයුතු වේ.

මන්ද ස්තූපය සැබැවින්ම, වැස්ස ආකර්ෂණය කරන, ස්මාරකයක් බව ඒ පිළිබඳව කෙරුණු නවීන පර්යේෂණ සාක්ෂි දරයි. ස්තූපය, වර්ෂාව ආකර්ෂණය කරගැනීම යන කාර්යය සඳහා වාස්තු විද්‍යාත්මකව ඉදිකර ඇති බවට සාක්ෂි සපයන පර්යේෂණයක් සිදු වී ඇතැයි මා හට දැන් වූ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ, ආචාර්ය උපාධි අපේක්ෂක රමේෂ් සූරියආරච්චි මහතා, එම පර්යේෂණය සිදු කළ පර්යේෂකයාගේ අත් පිටපතක් මා වෙත යොමු කළේය.

පුරාවිද්‍යා පර්යේෂකයෙකු වූ නිමල් ජයසිංහ මහතා, රුවන්මැලි දාගැබේ පාදම හා එහි ක්‍රියාකාරීත්වය පිළිබඳව සිදුකළ පර්යේෂණයකදී, එහි පාදම, යකඩ දැල්, රිදී ලෝහ ස්තර, සහිත එකක් බව, මහා වංශය ද පරිශීලනය කරමින් පවසයි. මේ නිරීක්ෂනය ඇසුරින් ඔහු ලියූ The construction details Schematic of the base of mahatupa as described in Mahawan නම් ලිපියේ දාගැබක සදුවන විදුලි ආරෝපණ උත්පාදක ක්‍රියාවලිය පැහැදිලි කරයි. ඔහු එහිලා 1987 දී, අබුහම් බෙනට් නම් විද්‍යාඥයා විසින් ආදර්ශනය කරන ලද Electroscope නම් උපකරණය තුළ, සිදුවන ක්‍රියාව චෛත්‍යයක ද සිදුවන බව පැහැදිලි කරයි. චෛත්‍යයේ පාදම තුළ එක්රැස්වන විදුලි ආරෝපණ, චෛත්‍ය මධ්‍යයේ ඇති ස්තම්භයක් වූ යූප යෂ්ටිය මඟින් ඉහළට ප්‍රක්ෂේපණය වෙමින් කොත තුළින්, විහිදුවන බව නිමල් ජයසිංහගේ අදහසයි. මේ ක්‍රියාවලිය වැස්ස ඇතිවීම කෙරේ කෙසේ බලපාන්නේදැයි පැහැදිලි කරන පරිගණක ඉංජිනේරු ජානක ඇඹුල්දෙණිය තම "පෞරාණික චෛත්‍ය හා එහි විද්‍යාත්මක පසුබිම " (2007) කෘතියේ මනා විද්‍යාත්මක පැහැදිලි කිරීමක යෙදෙයි.

නිමල් ජයසිංහගේ ආදර්ශන සටහන



නිමල් ජයසිංහ දක්වන අන්දමට චෛත්‍ය පාදමේ සිට පැන නැගෙන ධන විදුලි ආරෝපණ යූප යෂ්ටිය ඔස්සේ විහිදී පැරණි දාගැබ්වල පැවති ඡත්‍රය හෙවත් පසුකාලීන දාගැබ්වල වූ කොත්කැරැල්ල ආරෝපණය වෙයි. අහසෙහි වූ වළාකුල සමන්විත වන්නේ ඍණ ආරෝපණ වලිනි. එවිට දාගැබත් අහසත් අතර විදුලි කෙටීමක් සිදු වෙයි. එසේ විදුලි කෙටීමේදී අහසෙහි වළාකුලෙහි වූ ඍණ ආරෝපණ මේඝගර්ජනාවක් ලෙස චෛත්‍ය දෙසට පොලා පනියි. මේ සිදුවන අකුණු සැර හෙවත් විදුලි කෙටීම්වලදී වාතයේ ඇති නයිට්‍රජන් (N_2) හා ජල අංශුද මිශ්‍ර වෙමින් නයිට්‍රේට් (NH_3) සහ නයිට්‍රජන් ඔක්සයිඩ් (NO_2) නිර්මානය වෙයි. නයිට්‍රජන් ඔක්සයිඩ් මගින් ශාක වර්ධනයට අවශ්‍ය ඇමෝනියා (NH_3) නිපදවෙයි. විදුලි කෙටීම්වලින් පසු ඇතිවනක වැස්ස මඟින් මේ ලවණ පස මත පතිත කෙරේ. මේ ආකාරයෙන් දාගැබක් අවට ඇති වැවු වලටද ඒවා මිශ්‍ර වෙයි. ඒ ජලය වී වගාව හා වෙනත් භෝග සරු කරයි

ජනක ඇඹුල්දෙණිය තව දුරටත් ප්‍රකාශ කරන අන්දමට නුවර කලාවිය (නුවර වැව, කලා වැව හා පදවිය වැව සහිත ත්‍රිකෝණය) පෙදෙස, පැරණි අනුරාධපුර යුගයේ පැවති සශ්‍රික පෙදෙසක් වූයේ මේ ක්‍රියාවලිය මඟින් නිරන්තරව එම පෙදෙස පෝෂණය වන බැවිනි. ඒ අනුව පැරණි ස්තූපය වර්ෂාව උත්තේජනය කරන ආකාරයත් ගොවිතැනට අවශ්‍ය නයිට්‍රජනිය සරු පස සාදන ආකාරයත් පැහැදිලි වෙයි.

ඉහත ගෙන හැර දක්වා ඇති විස්තරය මඟින් අප වටහා ගත යුතු මූලික කරුණ වන්නේ, මෙම පැරණි ස්තූප ශ්‍රද්ධාව, භක්තිය වැනි ආගමික මනෝභාව ඉස්මතු කිරීමට පමණක් නොව කෘෂිකාර්මික ශිෂ්ඨාචාරයකට අවශ්‍යම සම්පතක් වූ වර්ෂා ජලය ගබා ගැනීමේ පුරාණ තාක්ෂණයකටද සම්බන්ධ බවයි. අන්තර්ජාතික පුවත්පත් කලාවේදියෙකු වූ මිහිඳු කුලසූරිය සුසන්ත ප්‍රනාන්දු ලියා ඇති Alien Mysteries in Srilanka & Egypt නම් කෘතියේ තුන්වන පරිච්ඡේදයේ දැක්වෙන්නේ අනුරාධපුර ප්‍රධාන ස්තූප තුන අහසේ ඔරංයාත් තාරකා රාශිය සමඟ නක්ෂත්‍ර විද්‍යාත්මකව සමපාත වන බවය. එසේම ඊජිප්තුවේ ප්‍රධාන පිරමීඩ තුනද එබඳුම සමපාත බවක් දක්වන බව ඔහුගේ නිරීක්ෂණයයි.

එසේම ස්තූපයක අර්ධ ගෝලාකාර හැඩය පවා ආකාශයේ කුඩා කළ ආකෘතියක් වැනි වෙයි. මෙම ප්‍රධාන ස්තූප මෙන්ම පිරමීඩද අපට දැනට සොයාගත නොහැකි සම්බන්ධයකින් විශ්වය සමඟ

“ නුවර කලාවිය නුවර වැව, කලා වැව හා පදවිය වැව සහිත ත්‍රිකෝණය පෙදෙස,
පැරණි අනුරාධපුර යුගයේ පැවති සශ්‍රික පෙදෙසක් වූයේ
මේ ක්‍රියාවලිය මඟින් නිරන්තරව එම පෙදෙස
පෝෂණය වන බැවිනි. ඒ අනුව පැරණි ස්තූපය වර්ෂාව උත්තේජනය කරන ආකාරයත්
ගොවිතැනට අවශ්‍ය නයිට්‍රජනිය සරු පස සාදන ආකාරයත් පැහැදිලි වෙයි ”

සැකසුම
මහාචාර්ය සාලිය කුලරත්න
සිංහල අංශය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය.